# වෙළඳ බැංකු පිළිබඳ මහජන පක්ෂ ස්ථාවරය

මූලිකව ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම විදේශීය බැංකුවල කටයුතු තියුණු අවධානයකට ලක් කොට ඒවායේ කටයුතු ජාතික සැලැස්මේ පරමාර්ථයන්ට අනුව මෙහෙය වියයුතු වේ. එයට එකඟ නොවන සහ සහයෝගය නොදක්වන ශාඛා මෙරටින් එවිට ඉවත්ව යනු ඇත.

දේශීය බැංකුවල අනාගත පැවැත්ම ශක්තිමත් කිරීම අරභයා ලාභදායක කටයුතු අවම වශයෙන් රජය සහ සංස්ථාවලට අදාල කටයුතු ගිණුම් පැවැත්වීම දේශීය බැංකු මගින් කළහැකි වේ. මෙය කොමිස් ගැහීම ඇතුළු රාජ්‍ය ආයතන වල පවත්නා බොහෝ  දූෂණ ඉතා අඩු මට්ටමකට පත් කිරීමටද හේතු වේ.

දැනට මූල්‍ය සමාගම් නැතහොත් ෆිනෑන්ස් සමාගම් ඒවා අයිති කීපදෙනෙකුගේ පරිභෝජන රටාව පෝෂණය කිරීමටද ණය ගන්නා අය අධික පොලී බරින් පෙලීමටද හේතුවී ඇත. දැනටමත් සමහර මෙවැනි සමාගම් බංකොලොත් තත්වයකට පත්ව ඇති අතර එහි පාඩු  විදීමට සිදු වනුයේ තැන්පත් කරුවන්ටය. මෙම තත්වය මතුවීමට මූලික හේතුව විදේශීය බැංකු මෙන්ම පිනෑන්ස් සමාගම්වලටද දේශීය බැංකු හා සසඳන කල ලිහිල් සුරතල් ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමය.

එවැනි තත්වයන් ඉවත් කිරීමද දේශීය වෙළඳ බැංකු පෝෂණයටද අවසාන වශයෙන් දේශීය බැංකු මූල්‍ය සම්පත් ජාතියේ බහුතරයකගේ ජීවන තත්වය නංවාලීමට යොදාගත හැකි බවද අපගේ විශ්වාසයයි. ඉතාම වැදගත් කරුණක් වනුයේ දේශීය බැංකුවල සේවක සම්පත කලකිරීමෙන් මුදා තමන් ජාතික කටයුත්තක කොටස්කරුවන් බවට පත්කිරීමට ඔවුන්ගේ සේවය ලබන පොදු මහජනතාවට වඩාත් කාර්යක්ෂම සහ වැඩි දියුණු සේවයක් ලබාදීමය.